බළන්ගොඩ නගර සභාව

2026-06-26 දිනැති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව

ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව

දිනය - 2026.06.26

වේලාව -පෙ.ව. 10.00

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති එන්.ඩබ්.පී.ටී ජයසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින විශේෂ මහ සභාවේ කටයුතු පවත්වන ලදී.

සහභාගීත්වය

1. ගරු සභාපති	එන්.ඩබ්.පී.ටී ජයසේන මැතිතුමා
2.ගරු උප සභාපති	නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රී	ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා
4.ගරු නාගරික මන්ත්‍රී	එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා
5. ගරු නාගරික මන්ත්‍රී	එම්.ඩබ්.විමලසිරි මැතිතුමා
6.ගරු නාගරික මන්ත්‍රිනී	සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය
7. ගරු නාගරික මන්ත්‍රිනී	පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය
8. ගරු නාගරික මන්ත්‍රී	ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා
9. ගරු නාගරික මන්ත්‍රී	එස්.යූ.සී ජයනක මැතිතුමා
10. ගරු නාගරික මන්ත්‍රී	එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා
11. ගරු නාගරික මන්ත්‍රී	ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා
12. ගරු නාගරික මන්ත්‍රී	ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා

නිළධාරි සහභාගීත්වය

1. ලේකම්	එස්.එච්.ඒ කරුණාරත්න මිය

මෙදින විශේෂ මහ සභාවේ වැඩ කටයුතු පෙ.ව. 10.00 ට ආරම්භ කළ ගරු සභාපතිතුමන් විශේෂ මහ සභාව සඳහා සහභාගී වූ ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලා සහ සභාවේ කාර්ය මණ්ඩලය පිළිගන්නා ලදී.

01. 2026 වර්ෂයට අදාළව පළාත් පාලන මාර්ග සංවර්ධන සැලැස්මට අදාළව අනුමත කරන ලද දෙහිගස්තලාව මුස්ලිම් සුසානභූමිය අසලින් දිවෙන එෆ්.එච්.මාවත සංවර්ධනය කිරීම කර්මාන්තය ඉටු කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම.

ඇස්තමේන්තු වටිනාකම-රු.4,200,000.00

වැඩ වටිනාකම -රු.3,429,044.35

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

02.**එෆ්.එච්.මාවත සංවර්ධනය කිරීමේ කර්මාන්තය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයන් ලෙස පහත නිලධාරීන් පත් කිරීමට සහා අනුමැතිය ලබා ගැනීම.**

I. කේ.පී.ඩී කරුණානායක මයා -සභාපති-විධායක ඉංජිනේරු බළන්ගොඩ.
II. ට්.ජී.ඒ.සී හේමපාල මිය- සාමාජික -ගණකාධිකාරී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
III. එම්.එන්.පී මුණසිංහ මයා-සාමාජික- කාර්මික නිලධාරී බළන්ගොඩ නගර සභාව

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

11. අවසානය

අනතුරුව ගරු සභාපතිතුමා අද දින ගරු සභාව වෙත සහභාගී වී අද්දින විශේෂ මහ සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය, කාර්ය මණ්ඩලය සඳහා වෙතද ස්තූතිය පුදකරමින් පෙ.ව.10.15 ට පමණ මෙදින විශේෂ මහ සභාවේ කටයුතු අවසන් කරන ලදි.

එන්.ඩබ්.පී.ටී ජයසේන,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.